#  ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2268/14 - 2022 පෙබරවාරි මස 22 වැනි අඟහරුවාදා - 2022.02.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බද්දේගම ප්‍රාදේශීය සභාව

විනෝද බද්ද

(267 වන අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ජුලි මස 30 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ යෝජනා අංක 05.19 යටතේ සම්මත කරන ලද පහත යෝජනාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (2) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාතේ, ආණ්ඩුකාරවර විලියම් විජේසිංහ ගමගේ වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් කාරුණිකව නිවේදනය කරනු ලැබේ.

**විලියම් විජේසිංහ ගමගේ,**  
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2021 දෙසැම්බර් මස 31 වැනි දින,  
ගාල්ල,  
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**යෝජනාව**

(267 වන අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බද්දේගම ප්‍රාදේශීය සභාව, සභාවේ පරිපාලන සීමා ඇතුලත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී, ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට කරනු ලබන ගෙවීමකින් 10% (සියයට දහයක) ට සමාන මුදලක්, බද්දක් වශයෙන් පනවා අය කළ යුතු යැයි ද, මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද යෝජනා කරන්නීය. එසේම, ඉහත පනවන ලද විනෝද බද්ද, එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරුන් විසින් නිසි ලෙස බද්දේගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් බද්දේගම ප්‍රාදේශීය සභාව වැඩිදුරටත් යෝජනා කරන්නීය.

EOG 02 - 0572